ජාතික ජන බලවේග පාක්ෂිකයින්,

මීගමුව.

2025.01.10

ගරු ජනාධිපති අනුර දිසානායක මැතිතුමා.

ජනාධිපති මන්දිරය, කොළඹ 01.

**<u>මීගමුව ජාතික ජනබලවේගයේ මරණ වරෙන්තුව ලිවීමේ කොන්ත්‍රාත්තුව ලාන්සා භාර දුන්නේ,</u>**

**<u>කම්කරු ඇමති අනිල් ජයන්තටද?</u>**

**<u>කම්කරු නියෝජ්‍ය ඇමති මහින්ද ජයසිංහටද?</u>**

**<u>ජනාධිපති ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ ලේකම් කපිල ජනක බණ්ඩාරටද?</u>**

**<u>බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර හනීෆ් යූසුෆ්ට ද?</u>**

මීගමුව තුළ ඉතා දිගු කාලයක සිට පැවති ලාන්සලාගේ දේශපාලනය සහ රාජ්‍ය දේපල අවභාවිතය අවසන් කිරීමට තිබූ සැබෑ උවමනාව මෙවර මහ මැතිවරණයේදි මීගමුව ජනාතාව විසින් පෙන්වා දී ඇත. දේශපාලනයේ පෙර පාසල පළාත් පාලන ආයතනය වන අතර, මෙවර පත්වූ ජාතික ජන බලවේගයේ දේශපාලන නායකත්වයේ බොහෝ දෙනා එම අත්දැකීම් රහිත බව අපි දනිමු. නමුත් යමක් විචාරශීලීව විමසා බැලීමේ හැකියාව ඇති පිරිසක් පත් වූ බව සිතමු.

මීගමුව මහ නගර සභාවේ වසර 20 කට ආසන්න කාලයක් දේශපාලන බලධාරීත්වය දරමින්, මහ නගර සභාවේ දේපළ අවභාවිත කරමින් කෝටි ගණන් මුදල් උපයන්නට ලාන්සා පවුල කටයුතු කළ ආකාරය මීගමුව ජනතාව අපූරුවට දැක ඇත. අයියා මල්ලී පමණක් නොව තාත්තාද නගර සභාවේ සේවකයින් අමතා ඉටුකරගත් රාජකාරී අපමණය. පසුගිය දේශපාලන සමය තුළ නගර සභාවේ පඩි ලබමින් ලාන්සලාගේ දේශපාලන ව්‍යාපාරයට පූර්ණකාලීනව නිදහස් කළ සේවකයින් ද 10 දෙනෙකුට අධික විය. සභාවේ සේවකයින් පමණක් නොව කාර්යාල උපකරණ පරිගණක, ඡායාපිටපත් යන්ත්‍ර ආදියද ඔවුන්ගේ කාර්යාලවල කටයුතුවලට නිදහස් කර තිබුණි. ඒ එවකට සිටි නාගරික කොමසාරිස්ගේද ආශිර්වාදය යටතේ විය.

මහ නගර සභාවේ නාගරික කොමසාරිස් තනතුර, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු පන්තියේ තනතුරකි. පසුගිය වසර ගණනාවක සිට පළමු පන්තියේ නිලධාරින් මෙම ආයතනයට පැමිණීමට සිතුවේවත් නැත. ඒ ලාන්සා පාලනය පිළිබඳ තිබූ භිතියයි. බොහෝ අවස්ථාවලදී පරිපාලන සේවයට පත්වන නවක නිලධාරීන්ගෙන් හෝ විශ්‍රාමික නිලධාරින්ගෙන් මෙම ආයතනය පාලනය විය. නවක නිලධාරින් අකමැත්තෙන් හෝ එවීමට ඉහළ නිලධාරින් කටයුතු කළ අතර, විශ්‍රාමිකයින් ඔවුනගේ පෞද්ගලික් අවශ්‍යතා මත හෝ දේශපාලන අවශ්‍යතා මත සේවයට පැමිණ ඇත.

පසුගිය වසර 03 කට අධික කාලයක් ලාන්සලාගේ අවශ්‍යතාවය මත පැමිණි විශ්‍රාමික නිලධාරියෙකු පරිපාලනය කළ අතර, නගරාධිපති දයාන් ලාන්සා නගරාධිපති පුටුවේ වාඩි වී නොසිටීම පමණක් එම කාලයේ වෙනනස් වූ අතර. අනෙකුත් සියළු කාර්යයන් ඔහුගේ අණසක යටතේ සිදු විය. එම කොමසාරිස්වරයාගේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට ඉල්ලීම් යොමු කර තිබූ නමුත් එම නිලධාරියාට විරුද්ධව ලැබී තිබූ පැමිණිලි ප්‍රමාණය හේතුවෙන් ඔහුගේ සේවය අවසන් කරන ලදි. ඉන් පසුව නගර සභාවට නාගරික කොමසාරිස් ලෙස පෙර මෙම ආයතනයේ සේවය කරමින් සිට ස්ථාන මාරු ලද නිලධාරිණියක පැමිණි අතර, ලාන්සා පාලනයේ තිබූ කටයුතු පියවරෙන් පියවර අවසන් කරමින් පැවතිණි. ඒ අතර පහත කරුණු ප්‍රමුඛ වේ.

- ලාන්සාගේ කාර්යාලයේ දේශපාලන කටයුතුවල නිරතව සිටි පිරිසගේ වැටුප් අත්හිටුවීමත්, සේවයට වාර්තා නොකරම වැටුප් ලද අයගේ සේවය අවසන් කිරීමත් සිදුකළ අතර, පසුව ඉදිරිපත් කල වෛද්‍ය වාර්තා අනුව නිවාඩු අනුමත කළ හැකි සේවකයින් හට නිවාඩු අනුමත කර විධිමත් පරිදි රාජකාරි පවරා ඇත. නිවාඩු අනුමත කළ නොහැකි පිරිසගේ වැටුප් රහිත නිවාඩු ලෙස වැටුප් අයකර ඇත.

- ව්‍යාපෘති සේවකයින් ස්ථිර කිරීමේදී චක්‍රලේඛ උල්ලංඝණය කරමින් සිදුකර තිබූ ස්ථිර කිරීම් පිළිබඳ කටයුතු කරමින් පැවතිනි.
- විදුලි පහන් නඩත්තුව අත්හිටුවා තිබූ අතර, ගෙන්වා තිබූ විදුලි පහන් විශාල ප්‍රමාණයක් කොමසාරිස්වරයාගේ අනුදැනුම යටතේ අතුරුදන්ව තිබිණි. ඒ පිළිබඳ පරීක්ෂණයක් සිදුකිරීම සඳහා කමිටුවක් පත්කර නව විදුලි පහන් ගෙන්වා අළුත්වැඩියා කටයුතු සැලසුමකට අනුව විධිමත්ව සිදුකිරීමට පියවර ගැණිනි.
- මාර්ග නඩත්තුව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය වෙනුවෙන් වෙන් කර තිබූ මුදල් වෙනත් කටයුතු සඳහා යොදවාගෙන තිබූ බැවින් එම කටයුතුද අත්හිටුවා තිබිනි. ඒ සඳහා නැවත ප්‍රතිපාදන වෙන් කර මාර්ග නඩත්තු කටයුතුද ආරම්භ කරන ලදි.
- ලාන්සාගේ හිතවතුන් වන සභාවේ පොළ බදුකරුවන් වෙත කිසිදු හේතුවක් රහිතව ලබා දී තිබූ ලක්ෂ ගණනක බදු සහන අදාල තොරතුරු පරික්ෂා කර නැවත අයකර ගැනීමට කටයුතු කරන ලදි.
- නත්තල් සමය තුළ නගරයේ තාවකාලික කඩකුටි ඉදිකිරීමට අවසර ලබා දීම පෙර වසර වලදී ලාන්සාගේ ගෝලයින්ගේ ආදායම් මාර්ගයක් ලෙස ඔවුන් මගින් සිදුකළ අතර, සභාවේ ආදායම ලක්ෂ 4 ක් පමණ විය. මෙවර එම කටයුතු විධිමත්ව හා විනිවිද භාවයෙන් සිදුකර ලක්ෂ 70 කට අධික ආදායමක් සභාවට ලබා ගැණිනි.
- නත්තල් සමයේ නගරය සහ කාර්යාල ගොඩනැගිල්ල විදුලි පහන් යොදා අලංකාර කිරීමේ කටයුතු සඳහා වාර්ෂිකව ලක්ෂ 25 කට වැඩි වියදමක් දරණ අතර. ලාන්සාගේ ගෝලයින්ගේද අමතර ආදායම් මාර්ග විය. මෙවර ඒ සඳහා වැය වී තිබුණේ ලක්ෂ 6 කට අඩු ප්‍රමාණයකි.
- ප්‍රදේශය තුළ ඉටු කල යුතු වූ කාණු ඉදිකිරීම්. මාර්ග සංවර්ධනය කිරිම් පිළිබඳ ජනතා ඉල්ලීම් කොතරම් පැවතියද සභාවේ අවධානය යොමු වී පැවතියේ ඉදිවෙමින් පවතින පොදු වෙළඳපල සහ පුස්තකාල ගොඩනැගිල්ලේ කටයුතු සඳහා පමණි. වාර්ෂික අයවැය තුළ ප්‍රයෝජනයට නොගත් ප්‍රතිපාදන වැය මාරු සිදුකර අත්‍යවශ්‍ය බවට හඳුනාගත් මහජන ඉල්ලීම්වලට අදාල ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කිරීමට පියවර ගැනිනි.
- වර්ෂාව සමය තුළ ජලගැලීම්වලින් පීඩාවට පත්වූ ජනතාවගේ එම ගැටළු විසඳීමට කඩිනම් පියවර ගන්නා ලදි.
- නගරයේ පිරිසිදුකිරීම් කටයුතු පිළිබඳව නිලධාරින්ගේ අවධානය යොමු වී නොතිබූ අතර ලද පැමිණිලි බොහෝ විය. එම කටයුතුද විධිමත් කරන ලදි.
- වසර ගණනාවක් කණුවක් පමණක්ව තිබූ මීගමුවේ අනන්‍යතාවයක් වූ නගර මධ්‍ය යේ පිහිටි ඔරලෝසු කණුව අළුත්වැඩියා කිරීමට පියවර ගෙන ඇත.
- මීගමුව මහ නගර සභාව වෙත් සේවාවන් ලබා දෙන ආයතන වල ඉල්ලීම් මත වසරින් වසර කාලය දීර්ඝ කරමින් ටෙන්ඩර් ලබා දී තිබූ ආරක්ෂක සේවාව, කසල ඉවත් කිරීමේ සේවාව ආදිය විධිමත් පරිදි ටෙන්ඩර් කිරීමට තීරණ ගෙන ඇත.
- ලාන්සාට කොමිස් ගෙවන කොන්ත්‍රාත් ආයතනයට පමණක් ඉදිකිරිම් කොන්ත්‍රාත් ලබා දීමේ අරමුණින් පසුගිය වසර ගණනාවක් සඳහා කොන්ත්‍රාත් කරුවන් ලියාපදිංචි කර ගැනීමට කටයුතු කර නොමැති අතර 2025 වසර සඳහා අදාල ආයතන ලියාපදිංචි කර ගැනීමට කටයුතු කර ඇත.
- පසුගිය වසර කිහිපය තුළ ඍණ ශේෂයක්ව පැවති ගිණුම, මෙම වසරේ මූල්‍ය අතිරික්තයක් සහිත තත්වයට ගෙන ඒමට කටයුතු කළ අතර, විශාල මුදල් ප්‍රමාණයක් ඉතිර කර දීමට කටයුතු කර ඇත.
- මීගමුව වෙරළ උද්‍යානය ලාන්සලාගේ දේපලක් බවට පත්ව ඇති අතර, පසුගිය කාලය තුළ එහි මෙහෙයුම් කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය හරහා තමන් වෙත ලබා ගැනීමට යෙදූ උපක්‍රමය නිසි ලෙස ඉටු වී නොමැති අවස්ථාවකදීත්, එම ස්ථානයේ මුදල් අයකිරීමට ඉඩ හැර තිබූ අතර. ඒ පිළිබඳව විමසීම් කර එම කටයුතු සභාව විසින් සිදු කිරීමට සැලසුම් කර තිබිණි.

මාස 03 ක පමණ කාලයක් තුළ මෙලෙස කටයුතු කරමින් සිටියදී හදිසියේම මෙම ආයතනයට පළමු පන්තියේ නිලධාරිණියක පත්කර එවා ඇති අතර. එහි අවශ්‍යතාවය ඇති වූයේ ඇයිද යන්න අපට ගැටළුවකි. නවක නිලධාරිණියක් පැමිණීම පිටුපස විශාල කුමන්ත්‍රණයක් ඇති බව අපට හැගී යන අතර. ඒ පිළිබඳ පහත කරුණු දක්වමු.

1. හිටපු කොමසාරිස්වරියගේ කටයුතු ලාන්සා ගැත්තන්ට සහ ලාන්සලාට මහත් ගැටළුවක්ව පැවති බව නොරහසකි. එම කටයුතු හදිසියේ අත්හිටුවීම මෙහි පළමු ප්‍රතිපලය විය.
2. නව නිලධාරිණිය පැමිණීමට සති කිහිපයකට පෙර සිට ලාන්සලාගේ ගැතිකම් කරන සේවකයින් විසින් ඒ බව ප්‍රචාරය කර තිබිණි. එම නිලධාරිණිය පැමිණි මුල් අවස්ථාවම කඩා පැනීමක් ලෙස දර්ශනය වූ අතර. ඇය වෙනුවෙන් කිසිදු විරෝධතාවයක් නොතිබූ බැවින් එලෙස පැමිණීමේ අවශ්‍යතාවය කුමක්ද ගැටළු සහිතය. ඇතැම්විට ඒ ඇය දැනුවත්ව සිටි ආකාරය විය හැකිය.
3. නව නිලධාරිණිය පිළිගැනීමට වෙනත් කාර්යාලයක සේවක පිරිසක් පැමිණි අතර. ඔවුන් අතර වැඩි පිරිසද ලාන්සාගේ උදව්කරුවන් විය. නගර සභා කාර්ය මණ්ඩලයේ ලාන්සා ගැත්තන් පමණක් ඇය පිළිගැනීමට සහභාගී විය. පණිවිඩය ලැබී තිබුණේ ඔවුන්ටය.
4. නව නිලධාරිණිය රනිල් වික්‍රමසිංහ ජනාධිපති තුමා සහ නිමල් ලාන්සා පාර්ලිමේන්තු මන්ත්‍රී කාලය තුළ ජනාධිපති ලේකම් කාර්යාලයේ ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කළ සහකාර ලේකම්වරියකි. එම රජයේ ඔවුන්ට සමීපව රාජකාරි කළ නිලධාරිණියක දේශපාලනය සෘජුව සම්බන්ධවන මෙවැනි ආයතනයකට අනුයුක්ත කිරීම ගැටළු සහිතය.
5. සභාවේ නගරාධිපති හා මන්ත්‍රීවරුන් නොමැති කාල සීමාවකදී කොමසාරිස්වරයා සියළු බලතල, කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේ නිලධාරියා ලෙස සියළු වගකීම් ඉටු කළ යුතුය. මෙම නිලධාරිණිය පළාත් පාලනය පිළිබඳ ඉගෙන ගත යුතුය. ඉගෙනගෙන රාජකාරි ඉටුකරන කාලසීමාවකට මෙය කිසි සේත් සුදුසු නොවන කාලයකි. බලධාරීන්ට ඒ බව අවබෝධයේ තිබිය යුතුය.
6. පළාත් පාලන මැතිවරණයක් ආසන්නව පවතින අවධියකදී පවතින රජයේ ප්‍රතිපත්ති අනුව පළාත් පාලන ආයතනවල කටයුතු මෙහෙයවීම අදාල නිලධාරීන් මගින් සිදුකරවා ගත යුතු අතර. ඒ පිළිබඳ පළපුරුදු නිලධාරීන් සිටීම ඉතා අත්‍යවශ්‍ය වේ.
7. ලාන්සා යනු දේශපාලන පරිණත භාවය ඉහලින්ම ඇති ඩීල් කරන්නට ඉතාමත් දක්ෂ දේශපාලකයෙකි. ඒ බව පසුගිය පළාත් පාලන මැතිවරණයේදීද අපි දුටුවෙමු. ලාන්සා ගේ එක් දුරකථන ඇමතුමකට සභාවේ සියළු රාජකාරි ඉටුකර දුන් නිලධාරීන් සහ සේවකයින් විශාල ප්‍රමාණයක් සිටි අතර, ඔවුන් මේ වන විටද සභාවේ සේවයේ නියුතුව ඇත. ඔවුන් මගින් තම අවශ්‍යතා ඉටුකර ගැනීම ලාන්සලාට අපහසුවකින් තොරව සහ කොමසාරිස්ගේ අනුදැනුමකින් තොරවද සිදු කළ හැකිය.
8. නව නිලධාරිණිය පැමිණි දින සිට ලාන්සාගේ දුරකතන ඇමතුමට අවශ්‍ය රාජකාරි සහ කටයුතු සිදුවෙමින් පවතී. පෙර පැවති ස්ථානයට සභාව ගමන් කරමින් පවතින බව අපිට පෙනී යයි.
9. මෙම නිලධාරිණිය පැමිණීම පිළිබඳව මීගමුව ජාතික ජන බලවේගයේ කිසිවෙකු නොදන්නා බවත් ඔවුන්ගේ අනුදැනුමකින් තොරව මෙය සිදු කර ඇති බවත් අපට දැනගන්නට ලැබිණි. ඒ පිළිබඳ පසුව විමසීමේදී නිලධාරිණියගේ පන්තිය පිළිබඳ කරුණු දක්වමින් සාධාරණීකරණය කරන්නට මහින්ද ජයසිංහ ඇමතිවරයා ඉදිරිපත් වූ බවද දැනගන්නට ලැබිණි.
10. පෙර සිටි නිලධාරිණියද ශ්‍රී ලංකා පරිපාලන සේවයේම දෙවන පනන්තියේ නිලධාරිණියක වන අතර පළාත් පාලනය සහ මීගමුවත් මීගමුවේ දේශපාලනය පිළිබඳවත් හොඳින් දන්නා පළපුරුදු නිලධාරිණියකි. නව නිලධාරිණිය පළමු පන්තියේ වුවද පළාත්පාලනය පිළිබඳ පළපුරුද්දක් රහිත අයෙකු බව අපි දනිමු. නව නිලධාරිණියගේ පෞද්ගලික අවශ්‍යතාවයන්ට මුල් තැන දීම මෙම අවස්ථාවේදී ජාතික ජන බලවේගයේ දේශපාලකයන් විසින් කළ යුතු ක්‍රියාවක්ද යන්න නැවත සිතා බැලිය යුතුය.
11. මීගමුව යනු දේශපාලන ව්‍යාසනයක් තිබූ ප්‍රදේශයකි. එබැවින් මීගමුවේ හතර මායිමවත් නොදන්නා පිරිස් මීගමුව පිළිබද තීන්දු තිරන ගැනීම අනුවණ ක්‍රියාවකි.
12. හිටපු නිලධාරිණිය පත්කිරීම සිදුකර ඇත්තේද ආණ්ඩුකාරවරයා වන අතර, එම පත්වීම පිළිබඳ කිසිදු සැලකිල්ලක් නොදක්වමින් මාස 03ක පමණ කාලයක් ඇතුළත තවත් නිලධාරිණියක පත්කිරිමට ආණ්ඩුකාරවරයා කටයුතු කර ඇත. ආණ්ඩුකාරවරයාට මෙම නිලධාරිණියගේ පත්වීම කඩිනම් කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු කපිල ජනක බණ්ඩාර යන අය නිතර ඇමතුම් ගෙන ඇති බවත්, ඔහු මෙවැනි අකටයුතුකම් සිදුකරමින් නිලධාරීන් අපහසුතාවයට පත් කරන බවත් ප්‍රකටය.

13. මේ වන විට සභාව තුළ නිලධාරින් පිළිබඳ තොරතුරු ලබා දෙමින් නව කොමසාරිස්වරිය සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කරන්නේ සභාවේ ආදායම් පරික්ෂක ඉරංග ගුණසේකර යන අයයි. ඔහු ලාන්සාට ළඟම නෑදෑකමක් ඇති අයෙකි. දැනට වෙරල උද්‍යානය ඔවුන් විසින් භාරදී ඇත්තේද ඔහුටය. ඒවා රහසිගත තොරතුරුය.

මෙවැනි තත්වයක් යටතේ මීගමුව ජාතික ජනබලවේගයේ ඉරණම ගැන සැක සංකා ඇති වීම වැලැක්විය නොහැකිය. ලන්සලාගේ පාලනය තුරන් කිරීමට වෙහෙස වූ අපටත් ඉදිරිය අඳුරුය. ලාන්සලාගේ දේශපාලන පරිණතභාවය හමුවේ ජාතික ජනබලවේගයේ දේශපාලකයන්ට හැරෙන්නටවත් නොහැකිය. ජාතික ජනබලවේගයේ දේශපාලකයින් දේශපාලනයේ තවදුර යාමට බොහෝ ඉගෙනගත යුතුය. ලාන්සා හිතවාදියෙකු හෝ ලාන්සා හිතවතුන්ට සහය දක්වන නිලධාරියෙකු මීගමුව මහ නගර සභාවට පත් කළා යනු ජාතික ජන බලවේගය සියතින් ගෙල සිඳ ගැනීමකි. මහින්ද ජයසිංහ ඇමතිවරයා එය සාධාරණීකරණය කිරීමට ගන්නා උත්සාහය යම් පෞද්ගලික වාසියක් ලබා ගැනීමේ අරමුණ බව අපි සිතමු. ලාන්සා යනු ඩීල් කිරීමට හපනෙක් බව ලංකාවම දන්නා කරුණකි.

මීගමුව මහ නගර සභාව තුළ සිදුකරමින් පැවති කටයුතු මෙම පත්කිරීම සිදුකරමින් හදිසියේ අත්හිටුවීමටවත්, ලාන්සාගේ හැඳුනුම්කම ඇති නිලධාරිණියක පත්කළ බවට ප්‍රචාරය කරමින් ලාන්සා ගැත්තවුන් සතුටු කිරීමටත්, ජාතික ජන බලවේගයේ ඉරණම විනාශය දක්වා ගෙන යාමටත් කවුරුන් හෝ කොන්ත්‍රාත්තුවක් භාරගෙන ඇති බව අපට පැහැදිලිය. ඒ කවුරුන්ද යන්න සොයා බැලිය යුතුය.

**අතිගරු ජනාධිපති තුමනි. ඔබගේ අවධානය යොමුකර මීගමුව රැක දෙන්න.**

**ඉහත කරුණු සලකා බලා වහාම මෙය නිවැරදි කිරීම කළ යුතු බව අපි දකිමු. මීගමුව ජනතාවගේ අපේක්ෂාවන් මරා දැමීමට මෙලෙස ඔබට අයිතියක් නැති බවද අවධානයට යොමු කරමු. වසර ගණනාවක් අඳුරේ තිබූ මීගමුව නැවත ගොඩගැනීමට නොහැකි අගාධයට ඇද දාන්න එපා. අප මීගමුව ගැනත්, ලාන්සලා ගැනත්, නගර සභාවේ සේවකයින් ගැනත්, ලාන්සලාට එම සේවකයින් හරහා කටයුතු කළ හැටිත් කරන හැටිත් දන්නා නිසා මෙම ඉල්ලීම ඉදිරිපත් කරමු. වහාම මෙම කරුණු පිළිබඳ සොයා බලා මෙය නිවැරදි කර දෙන්න…**

**මහින්ද ජයසිංහ ඇමතිවරයාට කොතරම් කරුණු පැහැදිලි කළත් මෙම නව නිලධාරිණියට වැඩ කිරීමට අවස්ථාවක් ලබා දීමට කටයුතු කළ යුතු බවට නිර්දේශ කිරීමට තරම් අන්ධ ලෙස කටයුතු කරන්නේ කුමන සම්බන්ධතාවයක් නිසාද? ලාන්සලාගෙන් මුදල් සන්තෝෂම් ලබාගත්තේද? අපිට ගැටළු රාශියකි. අප බොහෝ සෙයින් කළකිරීමට පත්ව සිටිමු. මීගමුවේ පමණක් නොව ගම්පහ දිස්ත්‍රික්කයේම ජාතික ජන බලවේගයේ ක්‍රියාකාරින් බොහෝ ප්‍රමාණයක් මේ පිළිබඳව කළකිරීමට පත්ව සිටිමු. අශ්වයා ගිය පසු ඉස්තාලය වැසිමේ ප්‍රතිපලයක් නොමැති බවද සඳහන් කරමු. අසීරුවෙන් දිනාගත් ජනවරම, මෙලෙස පාවාදීමට කටයුතු කරන්නේද??? ඔබ ගන්නා පියවර පිළිබඳ අපි බලා සිටිමු.**

මීගමුව වෙනුවෙන්,

........................................

පිටපත්:-

1. ගරු අග්‍රාමාත්‍ය හරිණි අමරසූරිය මැතිනිය. අගමැති කාර්යාලය, කොළඹ. - අ.ක.ස
2. ගරු විජිත හේරත් අමාත්‍ය තුමා, දිස්ත්‍රික් නායක, ගම්පහ දිස්ත්‍රික්කය ජා. ජනබලවේගය. - අ.ක.ස
3. බස්නාහිර පළාත් ආණ්ඩුකාර තුමා, පළාත් සභා ගොඩනැගිල්ල, බත්තරමුල්ල. - අ.ක.ස
4. ආණ්ඩුකාර ලේකම්, බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ල, බත්තරමුල්ල. - අ.ක.ස
5. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ල, බත්තරමුල්ල. - අ.ක.ස